# කාර්ය සාධන වාර්තාව

## செயலாற்றுகை அறிக்கை

# Performance Report

## 2021

ජාතික අයවැය දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය

தேசிய வரவுசெலவுத் திட்டத் திணைக்களம்
நிதி அமைச்சு

Department of National Budget
Ministry of Finance

# 2021 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# ජාතික අයවැය දෙපාර්තමේන්තුව
# වැය ශීර්ෂ අංකය - 240

## පටුන


**1** ආයතනික පැතිකඩ/ විධායක සාරාංශය ..... 4

1.1 හැඳින්වීම ..... 4

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු ..... 4

1.3 ප්‍රධාන කාර්යයන් ..... 5

1.3.1 ඉදිරි වර්ෂය සඳහා ජාතික අයවැය සකස් කිරීම ..... 5

1.3.2 පවත්නා වර්ෂයේ ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම ..... 5

1.3.3 අත්තිකාරම් ගිණුම් කටයුතු ..... 6

1.3.4 අයවැය යෝජනා සම්බන්ධයෙන් කටයුතු කිරීම ..... 6

1.3.5 වෙනත් කටයුතු ..... 6

1.4 සංවිධාන සටහන ..... 7

2 ප්‍රගතිය හා ඉදිරි දැක්ම ..... 8

2.1 අයවැය සංශෝධන 2021 ..... 8

2.1.1 පරිපූරක ඇස්තමේන්තු ..... 8

2.1.2 විශේෂ නීති වොරන්ට් බලපත්‍ර ..... 8

2.2 විස්තරාත්මක කාර්ය සාධනය ..... 9

2.3 අත්තිකාරම් ගිණුම් කටයුතු ..... 13

2.4 රාජ්‍ය වියදම් කළමනාකරණය ..... 14

2.4.1 ප්‍රතිපාදන මාරු කිරීම ..... 14

2.4.2 පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ..... 14

2.4.3 රජයේ වියදම ..... 14

3 වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය (ජාතික අයවැය දෙපාර්තමේන්තුව) ..... 16

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ..... 16

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ..... 17

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ..... 19

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් ..... 20

3.4.1 වාර්තා කිරීමේ පදනම ..... 20

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය - අදාල නොවේ ..... 21

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය ..... 21

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය ..... 22

3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව ..... 22

4 කාර්ය සාධන දර්ශක ........ 23

4.1 රජයේ වියදම් දැරීම සම්බන්ධයෙන් 2021 වර්ෂයේ නිකුත් කළ චක්‍රලේඛ........ 23

5 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය........ 24

6 මානව සම්පත් පැතිකඩ ........ 25

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය ........ 25

6.2 මානව සම්පත් හිඟය සහ කාර්ය සාධනය ........ 25

6.3 මානව සම්පත් සංවර්ධනය ........ 25

7 අනුකූලතා වාර්තාව ........ 27

8 ඇමුණුම - I ........ 35

# ආයතනික පැතිකඩ/ විධායක සාරාංශය

## 1.1 හැඳින්වීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ පාර්ලිමේන්තු පනත් වල ප්‍රතිපාදන යටතේ වන නෛතික රාමුවක් තුළ සහ මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ මගපෙන්වීම යටතේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ. රජයේ ප්‍රතිපත්ති රාමුව තුල සමස්ථ මධ්‍යකාලීන සාර්ව ආර්ථික රාමුවට අනුකූලව ආංශික මධ්‍ය කාලීන වියදම් රාමුවක් (MTEF) මත පදනම්ව අයවැය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම / වියදම් කළමනාකරණය සඳහා මෙම දෙපාර්තමේන්තුව කටයුතු කරයි. මෙම ක්‍රියාවලියේ දී රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රජයේ ව්‍යවස්ථාපිත ආයතන සහ මහා භාණ්ඩාගාරයේ අනෙකුත් දෙපාර්තමේන්තු සමග නිරන්තර අන්තර් සම්බන්ධතාවයක් පවත්වාගෙන යනු ලබයි.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම

රාජ්‍ය මූල්‍ය සම්පත් ඵලදායී සහ කාර්යක්ෂම ලෙස වෙන් කිරීම් හා කළමනාකරණය තුලින් සමාජ - ආර්ථික සංවර්ධනය

### මෙහෙවර

පොදු භාණ්ඩ (Public goods) සහ තෝරාගත් සේවාවන් ඵලදායී ලෙස බෙදාහැරීම් සඳහා රාජ්‍ය මූල්‍ය සම්පත් ඇස්තමේන්තුගත කිරීම සහ විසර්ජනය කිරීමෙන් රජයේ සංවර්ධන අරමුණු සාක්ෂාත් කිරීම.

### අරමුණු

- මූල්‍ය සම්පත් කාර්යක්ෂම සහ ඵලදායී ලෙස ප්‍රතිපාදනය කිරීම
- මූල්‍ය විනය පවත්වා ගැනීම
- රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධතාවය තහවුරු කිරීම
- රාජ්‍ය ප්‍රතිපත්ති හා මූල්‍ය සීමාවන්ට යටත්ව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ වෙනත් රාජ්‍ය ආයතන සහ ව්‍යවස්ථාපිත ආයතන සඳහා වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම.

# 1.3 ප්‍රධාන කාර්යයන්

## 1.3.1 ඉදිරි වර්ෂය සඳහා ජාතික අයවැය සකස් කිරීම

ඉදිරි වර්ෂය සඳහා ජාතික අයවැය සකස් කිරීමට පහත සඳහන් කාර්යයන් සිදු කරනු ලැබේ.

- අනෙකුත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සමඟ සාකච්ඡා කර මධ්‍ය කාලීන අයවැය රාමුව (MTBF) නිමකිරීම සහ ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම
- අයවැය කැඳවීමේ චක්‍රලේඛය නිකුත් කිරීම
- වියදම් ඒකක සමඟ සාකච්ඡා කර කෙටුම්පත් ඇස්තමේන්තු සැකසීම
- වියදම් ඒකක සමඟ අයවැය සාකච්ඡා / උපදේශක රැස්වීම් මෙහෙයවීම
- අනෙකුත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තු ද විමසා ආදායම, වියදම, මූල්‍යකරණ (දේශීය හා විදේශීය) හා ණය ගැනීම් සීමාවන් පිළිබඳව තීරණය කිරීම
- විසර්ජන පනත් කෙටුම්පත සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ කටයුතු නිම කිරීම
- විසර්ජන පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ හා නීති කෙටුම්පත් සම්පාදකගේ අනුමැතිය ලබා ගැනීම
- විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම
- විසර්ජන පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පල කිරීම
- විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම (පළමුවර කියවීම සඳහා)
- සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් කෙටුම්පත් අයවැය ඇස්තමේන්තු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
- විසර්ජන පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදයට සහභාගී වීම
- විසර්ජන පනත් කෙටුම්පතේ කාරක සභා අවස්ථාවේ සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
- අයවැය තෙවනවර කියවීමට සහභාගී වීම - කාරක සභා අවස්ථාවේ විවාදය
- වොරන්ට් බලපත්‍ර සකස් කිරීම සහ මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම
- වියදම් දැරීම සඳහා බලය ලබා දීමේ චක්‍රලේඛය නිකුත් කිරීම

## 1.3.2 පවත්නා වර්ෂයේ ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම

ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් කටයුතු සිදු කරනු ලැබේ.

- අයවැය ක්‍රියාත්මක කිරීමට බලය ලබාදීම ඇතුළත්ව අදාල උපදෙස් හා චක්‍රලේඛ නිකුත් කිරීම
- අනුමත ප්‍රතිපාදන සීමාවන් තුළ ප්‍රකාශිත අරමුණු වෙනුවෙන්ම එම මුදල් යොදාගැනෙන බව සහ මූල්‍ය විනය පවත්වාගෙන යනු ලබන බව තහවුරු කිරීම සඳහා පාලන විධික්‍රම බලාත්මක කිරීම.
- ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය තහවුරු කිරීම පිණිස වියදම් කිරීමේ ආයතන සමඟ එක්ව කටයුතු කිරීම.

- ප්‍රතිපාදන වෙන් කිරීමේ කාර්යක්ෂමතාවය අරමුණුකොට ගෙන ප්‍රමුඛතා අනුව ප්‍රතිපාදන නැවත වෙන් කිරීම (reallocation) හා මාරු කිරීම Transfer)
- ‘‘පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම්’’ ව්‍යාපෘතිය (TMV) කළමනාකරණය කිරීම

### 1.3.3 අත්තිකාරම් ගිණුම් කටයුතු

වාණිජ, ගබඩා සහ රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සඳහා සීමා නිර්ණය කිරීම සහ වියදම් කිරීමේ ආයතන වෙතින් ලැබෙන ඉල්ලීම් පදනම් කරගෙන එම ගිණුම් වල සීමා සංශෝධනය කිරීම.

### 1.3.4 අයවැය යෝජනා සම්බන්ධයෙන් කටයුතු කිරීම

- අයවැය යෝජනා විශ්ලේෂණය කර වඩාත් සුදුසු ආයතන වෙත අදාල ප්‍රතිපාදන නිකුත් කිරීම හා අවශ්‍ය උපදෙස් නිකුත් කිරීම

- අවශ්‍ය පරිදි අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කිරීම, විශ්ලේෂණය කිරීම සහ අදාල ආයතන සම්බන්ධීකරණය කිරීම

- විශේෂ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම (වාහන ලීසිං / ජූලි වැඩ වර්ජක දීමනා / යතුරු පැදි ලබා දීම)

### 1.3.5 වෙනත් කටයුතු


- පාර්ලිමේන්තුවේ අනුකාරක සභාවක් වන රාජ්‍ය මුදල් කාරක සභාවේ (COPF) රැස්වීම් අවස්ථාවල දී භාණ්ඩාගාරය නියෝජනය කරමින් ඒවාට සහය දැක්වීම

- පාර්ලිමේන්තුවේ අනුකාරක සභාවන් වන රාජ්‍ය ගිණුම් කාරක සභාවේ (COPA) සහ රාජ්‍ය ව්‍යාපාර කාරක සභා (COPE) රැස්වීම් අවස්ථාවල දී භාණ්ඩාගාරය නියෝජනය කරමින් ඒවාට සහය දැක්වීම

- ජාතික අයවැයට අදාල වන අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳව නිරීක්ෂණ සැකසීම

- පාර්ලිමේන්තු කාරක සභාවල දී සහ අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා විසින් කැඳවන රැස්වීම්වල දී භාණ්ඩාගාරය නියෝජනය කිරීම

## 1.4 සංවිධාන සටහන




| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අ.ජ. | - | අධ්‍යක්ෂ ජනරාල් | අති.අ.ජ. | - | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | ගණකාධි | - | ගණකාධිකාරී |
| අ | - | අධ්‍යක්ෂ | නි.අ. | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ | පරි.නි. | - | පරිපාලන නිලධාරී |
| ස.අ. | - | සහකාර අධ්‍යක්ෂ | කළ.සේ.නි. | - | කළමනාකරණ සේවා නිලධාරී | භා.ප. | - | භාෂා පරිවර්තක |
| තො.තා.නි. | - | තොරතුරු තාක්ෂණ නිලධාරී | ස.නි. | - | සංවර්ධන නිලධාරී | කා.කා.ස. | - | කාර්යාල කාර්යය සහයක |

# 2 ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2021 වර්ෂය තුළ දී ව්‍යවස්ථාපිතව නියම කර ඇති ක්‍රියාපටිපාටි අනුගමනය කරමින් 2022 ට අදාළ වන අයවැය සකස් කරන ලද අතර 2021 අංක 30 දරන විසර්ජන පනත මඟින් ඒ සඳහා අවශ්‍ය නෛතික බලය ලබා දී ඇත.

එම කටයුතු සිදුකරන අතරම 2021 වර්ෂය සඳහා වූ 2020 අංක 07 දරන විසර්ජන පනතින් සම්මත කරන ලද අයවැය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම සහ සහායන් ලබාදීම ද සිදුකරන ලදී.

## 2.1 අයවැය සංශෝධන 2021

පරිපූරක ඇස්තමේන්තු පාර්ලිමේන්තුවේ සම්මත කිරීමෙන් හෝ මුදල් අමාත්‍යවරයා විසින් පරිපූරක විශේෂ නීති වොරන්ට් බලපත්‍ර නිකුත් කිරීම මඟින් පාර්ලිමේන්තුව මඟින් සම්මත කරනු ලබන අයවැය සාමාන්‍යයෙන් සංශෝධනය වේ.

### 2.1.1 පරිපූරක ඇස්තමේන්තු

සෞඛ්‍ය සේවා පුළුල් කිරීමටත්, රට වසා තැබීම හේතුවෙන් පීඩාවට පත් නිරෝධායන වූ පවුල්වලට සහ අඩු ආදායම්ලාභී පවුල්වලට සහන සැලසීමටත්, අනෙකුත් අනපේක්ෂිත වියදම් පියවා ගැනීමටත් ප්‍රතිපාදන ඇතුළත් කරමින් රුපියල් බිලියන 200 ක පරිපූරක ඇස්තමේන්තුවක් 2021.06.23 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර එදිනම අනුමත කරන ලදී.

2021 විසර්ජන පනත අනුමත කරන අවස්ථාව වන විට අමාත්‍යාංශය ස්ථාපිත කර නොතිබූ බැවින් ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය සඳහා 2021.08.05 දින පාර්ලිමේන්තුව විසින් රුපියල් මිලියන 11,843.7 පරිපූරක ඇස්තමේන්තුවක් අනුමත කරන ලදී. කෙසේ වෙතත්, සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ වෙන් කළ රු. මිලියන 11,659 ක් අවුරා තැබීම හේතුවෙන් මෙම පරිපූරක ඇස්තමේන්තුවේ ශුද්ධ බලපෑම රු. මිලියන 184.7 ක් පමණි.

### 2.1.2 පරිපූරක විශේෂ නීති වොරන්ට් බලපත්‍ර

විසර්ජන පනතේ 2 වන උපලේඛණයේ විශේෂ නීති සේවා ලෙස හඳුන්වා දී ඇති රජයේ වියදම් දැරීමට හැකිවනු පිණිස ඒකාබද්ධ අරමුදලින් මුදල් ලබා ගැනීමට බලය ලබාදෙමින් විශේෂ නීති සේවා බලපත්‍ර නිකුත් කිරීමට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් මුදල් අමාත්‍යවරයාට බලය ලබා දී ඇත. 2.1.2 වගුවේ සඳහන් කර ඇති කාර්යයන් සඳහා වන අතිරේක අරමුදල් අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස 2021 වර්ෂයේ දී මුදල් අමාත්‍යවරයා විසින් රු. මිලියන 162,530 ක් වටිනා එවැනි විශේෂ නීති සේවා බලපත්‍ර 04 ක් නිකුත් කර ඇත.

### 2.1.2 වගුව පරිපූරක විශේෂ නීති වොරන්ට් බලපත්‍ර

| අංකය | වැය ශීර්ෂ අංකය | ආයතනය | කාර්යය/අරමුණ | මුදල (රු) |
|---|---|---|---|---|
| 01 | 04 | උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වන සංශෝධනයට අනුව ශ්‍රේෂ්ඨාධිකරණයට සහ අභියාචනාධිකරණයට අළුතින් පත් කරන ලද විනිසුරුවරුන්ට වැටුප් ගෙවීම සඳහා | 28,000,000 |
| 02 | 20 | මැතිවරණ කොමිෂන් සභාව | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වන සංශෝධනය යටතේ කොමිෂන් සභාවට අළුතින් පත් කරන ලද සාමාජිකයන්ට වැටුප් ගෙවීම සඳහා | 2,160,000 |
| 03 | 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා | 19,000,000,000 |
| 04 | 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | ණය සේවාකරණය වෙනුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන සඳහා වන ඌණතාවය | 143,500,000,000 |

## 2.2 විස්තරාත්මක කාර්ය සාධනය

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ථ ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| 1. 2020 අංක 07 දරන විසර්ජන පනත ක්‍රියාත්මක කිරීම සහ වියදම් කළමනාකරණය | වියදම් කළමනාකරණය පිළිබඳ උපදෙස් ලබා දෙමින් වියදම් සඳහා බලය ලබා දීමේ චක්‍රලේඛ නිකුත් කිරීම. | රාජ්‍ය වියදම් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම. | 2020.12.23 දිනැති අංක 07/2020 දරන ජාතික අයවැය චක්‍රලේඛය (2021 අයවැය වියදම් දැරීම සඳහා බලය ලබා දීම සහ රාජ්‍ය වියදම් කළමනාකරණය) නිකුත් කරන ලදී. |
| | විසර්ජන පනතේ 5(1) වගන්තිය සහ මුරෙ 66 සහ මුරෙ 69 යටතේ අරමුදල් මාරුකිරීම සඳහා බලය ලබාදීම | අනුමත ඇස්තමේන්තු තුළ වියදම් කළමනාකරණය කර ගැනීම | එකී රෙගුලාසි අනුව ඉල්ලීම් 725 ක් වෙනුවෙන් බලය ලබා දී ඇත. එයින් ඉල්ලීම් 374 ක් වැඩසටහන් අතර මාරු කිරීම් සඳහා වන අතර 253 ක් ව්‍යාපෘති අතර මාරු කිරීම් සඳහා වේ. මාරු කිරීම් සඳහා වන ඉල්ලීම් 98 කට මුරෙ 69 යටතේ බලය ලබා දෙන ලදී. |
| | විසර්ජන පනතේ 6(1) වන වගන්තිය යටතේ ප්‍රතිපාදන නැවත විසර්ජනය කිරීම. | වියදම් කිරීමේ ආයතනවල මනා ක්‍රියාකාරීත්වය පිණිස ඒවායේ අතිරේක ප්‍රතිපාදන අවශ්‍යතාවන් ලබා දීම. | අනපේක්ෂිත සහ හදිසි ස්වභාවයේ වියදම් (උදා: කොවිඩ් 19 වසංගත තත්ත්වය) සහ වියදම් ඇස්තමේන්තුවල පැවති යම් යම් අපගමනයන් සපුරාලීම පිණිස වර්ෂය තුළ දී පරිපූරක ප්‍රතිපාදන සඳහා වූ ලිපි 1,060 ක් වෙනුවෙන් රු. බිලියන 421.1 ක ප්‍රතිපාදන ලබා දෙන ලදී. |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ථ ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| | පරිපූරක ප්‍රතිපාදන ලබාදීම පිළිබඳව පරිපූරක ඇස්තමේන්තු මාස දෙකකට වරක් පාර්ලිමේන්තුව ට ඉදිරිපත් කිරීම | විසර්ජන පනතේ ප්‍රතිපාදන අනුගමනය කිරීම | ලබා දුන් සියළුම පරිපූරක ප්‍රතිපාදන ආවරණය කරමින් වාර්තා 09 ක් ඉදිරිපත් කරන ලදී. |
| | 2020 අංක 07 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම | 2020 අංක 07 දරන විසර්ජන පනතේ 2(1)(ආ) වගන්තිය යටතේ දක්වා ඇති ණය ලබාගැනීමේ සීමාවන් සංශෝධනය කිරීම | 2021 අංක 26 දරන විසර්ජන පනත (සංශෝධන) |
| 2. 2022 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීම. | අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම. (අයවැය කැඳවීම) | සියළුම වියදම් කිරීමේ ආයතන විසින් මාර්ගෝපදේශ අනුගමනය කරමින් වාර්ෂික අයවැය සකස් කිරීම. | 2022 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ ඇතුළත් වූ අංක 01/2021 දරන චක්‍රලේඛය 2021.07.28 දින නිකුත් කරන ලදී. |
| | භාණ්ඩාගාරයේ අදාල දෙපාර්තමේන්තු හා වියදම් කිරීමේ ආයතන සමඟ සාකච්ඡා කර වාර්ෂික අයවැය ඇස්තමේන්තු කෙටුම්පත් සකස් කිරීම. | රජයේ ආර්ථික හා සංවර්ධන අරමුණුවල වාර්ෂික ඉලක්ක සපුරා ගැනීම තහවුරු කිරීම. | ගරු මුදල් අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පාර්ශවකරුවන් සමඟ පූර්ව අයවැය සාකච්ඡා පවත්වන ලදී. |
| | අදාළ අමාත්‍යාංශ සමඟ අයවැය සාකච්ඡා පැවැත්වීම. | වියදම් ප්‍රමුඛතා ගත කරමින් නිසි මූල්‍ය කළමනාකරණය ක් හා මූල්‍ය විනයක් සහිතව අදාළ මූල්‍ය ඉලක්ක ළඟා කර ගත හැකි පරිදි අයවැයක් සකස් කිරීම. | භාණ්ඩාගාර ලේකම්, නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරු හා අදාළ දෙපාර්තමේන්තු සහ ආයතන ප්‍රධානීන් සමඟ සමාලෝචන සාකච්ඡා පවත්වන ලදී. |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ථ ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| | 2022 සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැළසීම. | විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.<br><br>2022 කාර්යයන් අනුව සකස් කරන ලද අයවැය ඇස්තමේන්තු මුද්‍රණය කිරීම සහ සවිස්තර ඇස්තමේන්තු සකස් කිරීම.<br><br>විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කිරීම. | 2022 වර්ෂය සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත 2021.09.24 දින ගැසට් පත්‍රයේ පළ කිරීම.<br><br>විසර්ජන පනත් කෙටුම්පත 2021.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. (පළමුවර කියවීම)<br><br>2022 කාර්යයන් අනුව සකස් කරන ලද අයවැය ඇස්තමේන්තු නියමිත දිනට මුද්‍රණය කිරීම හා සවිස්තර ඇස්තමේන්තු සකස් කිරීම.<br><br>2021.11.12 දින අයවැය කතාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. (දෙවන වර කියවීම)<br><br>2021.11.23 සිට 2021.12.10 දක්වා අයවැය විවාදය පැවැත්වීම.<br><br>2021.12.10 දින පාර්ලිමේන්තුව මඟින් විසර්ජන පනත් කෙටුම්පත සම්මත කිරීම.<br><br>2021 අංක 30 දරන විසර්ජන පනත 2021.12.10 දින ගරු කථානායකතුමා විසින් සහතික කිරීම. |
| | ගරු මුදල් අමාත්‍යවරයා විසින් වොරන්ට් බලපත්‍ර නිකුත් කිරීම.<br><br>වියදම් කළමනාකරණය පිළිබඳ උපදෙස් ලබාදෙමින් බලය ලබාදීමේ චක්‍රලේඛය නිකුත් කිරීම. | වියදම් සඳහා බලය ලබාදීම. | ගරු මුදල් අමාත්‍යවරයා විසින් 2021.12.13 දින වොරන්ට් බලපත්‍ර නිකුත් කරන ලදී.<br><br>2022 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා බලය ලබා දීම සහ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳව උපදෙස් ලබා දෙමින් අංක 03/2021 සහ 2021.12.21 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලදී. |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ථ ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| 3. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කළමනාකරණය. | පහත සඳහන් වාර්තා ඉදිරිපත් කිරීම.<br><br>(අ) මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ වියදම් සමාලෝචනය පරිච්ඡේදය<br><br>(ආ) දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව<br><br>(ඇ) විසර්ජන ගිණුම<br><br>(ඈ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම සැසඳීම | නියමිත කාලයට පෙර වාර්තා ඉදිරිපත් කිරීම. | පහත වාර්තා නියමිත දිනට ඉදිරිපත් කරන ලදී.<br><br>(අ) වියදම් සමාලෝචනය 2021<br><br>(ආ) කාර්ය සාධන වාර්තාව<br><br>(ඇ) විසර්ජන ගිණුම 2021<br><br>(ඈ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම සැසඳීම 2021 |
| | හැකියා වර්ධනය | දේශීය හා විදේශීය පුහුණු මඟින් මානව සම්පත් සංවර්ධනය. | විදේශීය ආයතන විසින් දායකත්වය සපයන ලද අන්තර්ජාලය ඔස්සේ පැවැත්වූ විදේශ පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් 06 ක් සහභාගී වී ඇති අතර ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ කාර්යයන් සඳහා අදාල වන පරිදි නිලධාරීන්ට දේශීය පුහුණු අවස්ථා ලබා දී ඇත. |
| | දෙපාර්තමේන්තු අත්තිකාරම් ගිණුම පාලනය කිරීම | අත්තිකාරම් ගිණුමේ සීමාවන්ට අනුකූලව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සෑම අයදුම්කරුවෙකුටම ණය අත්තිකාරම් ප්‍රදානය කිරීම | බලය ලබා දී ඇති සීමාවන් පිළිපදිමින් රු.4,814,387.40 ක් වටිනා ආපදා ණය, පාපැදි ණය, විශේෂ අත්තිකාරම් සහ උත්සව අත්තිකාරම් ලබා දී ඇත. |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ථ ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| | විගණන විමසුම්වල ට ප්‍රතිචාර දැක්වීම. | විගණන විමසුම් අවම කිරීම. | විගණකාධිපති දෙපාර්තමේන්තුව මඟින් එවන ලද සියළුම විගණන විමසුම් (විගණන විමසුම් අටක් 08) සඳහා පිළිතුරු ලබාදෙන ලදි. |
| 4. පාර්ලිමේන්තු කාරක සභා සඳහා සහාය දැක්වීම | රාජ්‍ය ගිණුම් කාරක සභාව, රාජ්‍ය ව්‍යාපාර කාරක සභාව සහ රාජ්‍ය මුදල් කාරක සභාව නියෝජනය කිරීම | පාර්ලිමේන්තු කාරක සභා සඳහා කැඳවීම් ලද විට දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් අවශ්‍ය සහභාගීත්වය ලබා දීම | කාරක සභා රැස්වීම් සඳහා කැඳවීම් සිදු කරන ලද සෑම කාරක සභා රැස්වීමක් සඳහාම නිලධාරියෙකු/නිලධාරීන් සහභාගී වී ඇත. |
| 5. විදේශීය සංවර්ධන පාර්ශවකරුවන්ට (ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව ආදී) පහසුකම් සැළසීම. | අවශ්‍ය අවස්ථාවල දී සංවර්ධන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡාවලට සහභාගී වීම. | සංවර්ධන පාර්ශවකරුවන් සමඟ අන්තර් සබඳතා පවත්වා ගැනීම. | අදාල අවස්ථාවල දී සංවර්ධන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වීම සඳහා භෞතිකව හෝ මාර්ගගතව සම්බන්ධ වී අවශ්‍ය කටයුතු සිදුකිරීම. |

## 2.3 අත්තිකාරම් ගිණුම් කටයුතු

2021 වර්ෂය සඳහා අත්තිකාරම් ගිණුම් කටයුතුවලට අදාළ සත්‍ය වියදම රු. බිලියන 19.95 ක් වූ අතර ඇස්තමේන්තුගත උපරිම වියදම් සීමාව රු. බිලියන 29.65 ක් විය. රු. බිලියන 23.65 ක් වූ ඇස්තමේන්තුගත අවම ලැබීම් සීමාව හා සැසඳීමේ දී සත්‍ය මුළු ලැබීම් රු. බිලියන 20.19 ක් විය. ඒ අනුව, 2020 අංක 07 දරණ විසර්ජන පනතේ අනුමත සීමාවන් තුළ අත්තිකාරම් ගිණුම් කටයුතු වෙනුවෙන් වියදම් දරා ඇති නමුත් ඇස්තමේන්තුගත අවම ලැබීම් ප්‍රමාණය ළඟාකර ගැනීමට හැකිවී නොමැත.

කොවිඩ් 19 ව්‍යාප්තිය සමඟ ආයතනවල සේවකයන් සේවයට කැඳවීම සීමා වීම හේතුවෙන් ණය ඉල්ලුම් කිරීම අඩුවීම හා 2020.12.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/2020 ප්‍රකාරව බැංකු හරහා පරිපූරක උත්සව ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වීම නිසා උත්සව අත්තිකාරම් ලබා දීම් සීමා වී ඇති බැවින් ණය අයකර ගැනීම් පහත වැටීම හේතුවෙන් ඇස්තමේන්තුගත ලැබීම් ප්‍රමාණය ළඟාකර ගැනීමට නොහැකි වී ඇත.

2020 වර්ෂයේ දී රු. බිලියන 16ක් වූ අත්තිකාරම් ගිණුම් කටයුතුවල වියදම 2021 වර්ෂයේ දී 25% කින් ද ඊට සමගාමීව 2020 වර්ෂයේ දී රු. බිලියන 16.5 ක් වූ එම කටයුතු වලින් ලැබීම් 2021 වර්ෂයේ දී 22% කින් ද වර්ධනය වී ඇත.

## 2.4 රාජ්‍ය වියදම් කළමනාකරණය

### 2.4.1 ප්‍රතිපාදන මාරු කිරීම

පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද මුළු වියදම් සීමාව තුළ මුදල් රෙගුලාසිවල සඳහන් වීරමෝං පටිපාටිය යටතේ, උපයෝජනය නොකළ ප්‍රතිපාදන මාරු කිරීමට විසර්ජන පනතේ 5 වන වගන්තිය මඟින් ආයතනයන්ට අවසර ලබා දී ඇත. ඒ අනුව, 2021 වර්ෂය තුළ දී රු. බිලියන 256 ක වටිනාකමකින් යුතු එවැනි මාරු කිරීම් 725 ක් සඳහා මුදල් රෙගුලාසි 66 හා 69 යටතේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී ඇත.

### 2.4.2 පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම්

වැය දරන ආයතනයන් හි පුරෝකථනය කළ නොහැකි හදිසි හා අනපේක්ෂිත අරමුදල් අවශ්‍යතා සඳහා 2021 මුද්‍රිත අයවැය ඇස්තමේන්තුවල දක්වා ඇති විශේෂිත මාර්ගෝපදේශයන්ට අනුකූලව අතිරේක ප්‍රතිපාදන ලබාදීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුව මඟින් 2021 වර්ෂයේ දී ද වැය ශීර්ෂ 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව, 2021 වර්ෂයේ දී විවිධ වියදම් ඒකක සඳහා රු. බිලියන 421.1 ක අතිරේක ප්‍රතිපාදන ලබා දී ඇත.

2020 අංක 07 දරන විසර්ජන පනතේ අවශ්‍යතාවයන් සපුරාලමින් එසේ ලබාදුන් අතිරේක ප්‍රතිපාදන සම්බන්ධව වාර්තා වරින් වර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. 2021 වර්ෂයට අදාලව මෙවැනි වාර්තා 09 ක් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී. ඊට අමතරව 2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය (වගකීම්) කළමනාකරණ පනතට අනුව එම අතිරේක ප්‍රතිපාදන ලබාදීම් පිළිබඳ තොරතුරු මුදල් අමාත්‍යාංශ වාර්ෂික වාර්තාවේ ද ඉදිරිපත් කරන ලදී.

### 2.4.3 රජයේ වියදම

ණය ආපසු ගෙවීම් ද ඇතුළත්ව 2021 වර්ෂය තුළ සමස්ථ රජයේ වියදම රු. බිලියන 4,879 ක් වාර්තා වී ඇති අතර 2020 රු .බිලියන 4,456 ක් වූ අගය හා සැසඳීමේ දී සියයට 9.49 ක් එනම් නාමික අගය සැළකූ විට රු බිලියන 423 ක වැඩිවීමකි.

රජයේ මුළු වියදමින් සියයට 57 ක් එනම් රු. බිලියන 2,757 ක් පුනරාවර්තන වියදම් වේ. එය 2020 වර්ෂයේ දී මුළු පුනරාවර්තන වියදම වූ රු. බිලියන 2,683 ක් හා සැසඳීමේ දී 2021 වර්ෂය තුළ සියයට 2.76 කින් වැඩි වී ඇත. 2021 වර්ෂයේ මුළු මූලධන වියදම රු. බිලියන 2,122 ක් වන අතර එය 2020 වර්ෂයේ වූ රු. බිලියන 1,774 හා සැසඳීමේ දී එය සියයට 19.62 ක වර්ධනයකි. මේ අතර 2020 වර්ෂයේ දී සියයට 93 ක් ව පැවති රජයේ මූලධන වියදම්වල උපයෝජන අනුපාතය 2021 දී සියයට 83 දක්වා කැපී පෙනෙන ලෙස අඩු වී ඇත.

**2.4. වගුව : වියදම් කාණ්ඩ අනුව රජයේ වියදම**

| පුනරාවර්තන වියදම | රුපියල් බිලියන | පුනරාවර්තන වියදමේ ප්‍රතිශතය | සමස්ත වියදමේ ප්‍රතිශතය |
|---|---|---|---|
| මුළු පුනරාවර්තන වියදම | 2,757.3 | 100 | 57 |
| මධ්‍යම රජයේ පුද්ගල පඩිනඩි | 612.0 | 22 | 13 |
| ගමන් වියදම් | 15.9 | 1 | 0 |
| සැපයුම් | 139.7 | 5 | 3 |
| නඩත්තු වියදම | 7.9 | 0 | 0 |
| සේවාවන් | 54.8 | 2 | 1 |
| මාරුකිරීම් (පළාත් සභා සහ රාජ්‍ය ආයතන වලට මාරුකිරීම් ද ඇතුළත්ව) | 878.4 | 32 | 18 |
| පොළී ගෙවීම් සහ වට්ටම් | 1,048.4 | 38 | 21 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 0.2 | 0 | 0 |
| **මූලධන වියදම** | **රුපියල් බිලියන** | **මූලධන වියදමේ ප්‍රතිශතය** | **සමස්ත වියදමේ ප්‍රතිශතය** |
| මුළු මූලධන වියදම | 2,121.9 | 100 | 43 |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 28.9 | 1 | 1 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 124.2 | 6 | 3 |
| මූලධන මාරු කිරීම් | 118.8 | 6 | 2 |
| මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 78.6 | 4 | 2 |
| හැකියා ප්‍රවර්ධනය | 5.8 | 0 | 0 |
| වෙනත් මූලධන වියදම් | 433.4 | 20 | 9 |
| රාජ්‍ය ණය ක්‍රමක්ෂය කිරීම | 1,332.2 | 63 | 27 |
| සමස්ත වියදම | 4,879.2 | | 100 |

# 3 වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය (ජාතික අයවැය දෙපාර්තමේන්තුව)

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| අයවැය 2021 රු. | | සටහන | තත්‍ය 2021 රු. | නැවත ගලපන ලද 2020 රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | | | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 2,910,000 | 509,454 | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **2,910,000** | 509,454 | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 410,292,000 | 2,386,322,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 21,396,032 | 26,668,135 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 16,157,388 | 14,383,959 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **447,845,420** | 2,427,374,094 | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **450,755,420** | 2,427,883,548 | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 355,051 | 347,871 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | 450,400,369 | 2,427,535,677 | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | | | |
| 117,900,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 98,176,842 | 105,977,054 | ඒසීඒ-2(ii) |
| 53,600,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 43,517,457 | 150,087,999 | ඒසීඒ-2(ii) |
| 37,300,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 17,980,424 | 22,259,019 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | 25,797,464,837 | ඒසීඒ-2(ii) |
| **208,800,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **159,674,723** | **26,075,788,909** | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **මූලධන වියදම්** | | | | |
| 200,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | **10** | 709,749 | 782,674 | ඒසීඒ-2(ii) |
| 283,405,600 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | **11** | 279,344,079 | 2,136,989,726 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | - | - | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | - | - | |
| 4,000,000 | හැකියා වර්ධනය | **14** | 663,200 | 152,200 | |
| - | වෙනත් මූලධන වියදම් | **15** | - | - | |
| 288,305,600 | **මුළු මූලධන වියදම් (උ)** | | **280,717,028** | **2,137,924,600** | |
| | තැන්පතු ගෙවීම් | | 32,128,384 | 193,325,103 | **ඒසීඒ-4** |
| | අත්තිකාරම් ගෙවීම් | | 10,612,288 | 12,826,575 | **ඒසීඒ-5** |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **42,740,672** | **206,151,678** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **483,132,423** | **28,419,865,187** | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | (32,732,054) | (25,992,329,510) | |
| | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය** | | (32,732,054) | (25,992,329,510) | **ඒසීඒ-7** |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | | | **ඒසීඒ-3** |
| | | | (32,732,054) | (25,992,329,510) | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**ඒසීඒ - පී**

### 2021 දෙසැම්බර් 31 දිනට
### මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | තත්‍ය 2021 | 2020 |
|---|---|---|---|
| | _ _ | රු. | රු. |
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | **ඒසීඒ-6** | 146,792,044 | 4,334,593,809 |

| | | | |
|---|---|---|---|
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | **ඒසීඒ- 5/5 (ඒ)** | 19,369,248 | 24,914,348 |
| මුදල් හා මුදල් සමාන දෑ | **ඒසීඒ -3** | | - |
| **මුළු වත්කම්** | | **166,161,292** | **4,359,508,157** |
| <u>ශුද්ධ වත්කම්/ ස්කන්ධය</u> | | | |
| ශුද්ධ වත්කම් | | 19,224,328 | 14,037,076 |
| දේපළ, පිරියත හා උපකරණ සංචිතය | | 146,792,044 | 4,334,593,809 |
| කුලී වැඩ හා අත්තිකාරම් සංචිතය | **ඒසීඒ- 5 (බී)** | | |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | **ඒසීඒ-4** | 144,920 | 10,877,272 |
| අග්‍රිම ශේෂය | **ඒසීඒ-3** | - | - |
| **මුළු වගකීම්** | | **166,161,292** | **4,359,508,157** |

පිටු අංක..01.....සිට ..100... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ..101..... සිට ..108.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ............................. | ............................. | ............................. |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : එස්. ආර්. ආටිගල | නම : ජූඩ්. නිලුක්ෂාන් | නම : ජී.ඩී.එම්. මුදිතා ගුණරත්න |
| තනතුර : ලේකම්, මුදල් අමාත්‍යාංශය | තනතුර : අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව | ජාතික අයවැය දෙපාර්තමේන්තුව |
| දිනය : 24.02.2022 | දිනය : 23.02.2022 | දිනය : 23.02.2022 |

එස්. ආර්. ආටිගල
මහා භාණ්ඩාගාරයේ සහ මුදල් අමාත්‍යාංශයේ ලේ...
මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01.

ජූඩ් නිලුක්ෂාන්
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අයවැය දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

ජී.ඩී.එම් ... ගුණරත්න
ගණකාධි...
ජාතික ... දෙපාර්තමේන්තුව
මහා භාණ්...
කොළඹ ...

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

### 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2021<br>රු. | තත්‍ය<br>නැවත ගලපන ලද<br>2020<br>රු. |
|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 39,177,897 | 198,993,187 |
| අග්‍රිම ලැබීම් | 410,292,000 | 2,386,322,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 12,177,795 | 11,903,643 |
| තැන්පතු ලැබීම් | 21,396,032 | 26,668,135 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **483,043,724** | **2,623,886,965** |
| | | |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 141,026,699 | 255,971,403 |
| සහනාධාර සහ මාරුකිරීම් | 17,980,424 | 22,259,019 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | (60,000) | 1,081,237 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 355,051 | 983,479 |
| අත්තිකාරම් ගෙවීම් | 10,896,138 | 12,977,732 |
| තැන්පතු ගෙවීම් | 32,128,384 | 193,325,103 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **202,326,696** | **486,597,973** |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **280,717,028** | **2,137,288,992** |
| | | |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | **-** | **-** |

| | | |
|---|---|---|
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 280,717,028 | 2,137,924,600 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **280,717,028** | **2,137,924,600** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | **(280,717,028)** | **(2,137,924,600)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ)+(ඊ)** | **-** | **(635,608)** |
| <u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **-** | **-** |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **-** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | **-** | **(635,608)** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **635,608** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **-** | **-** |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

### 3.4.1 වාර්තා කිරීමේ පදනම

1) <u>වාර්තා කරන කාලපරිච්ඡේදය</u>

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

**2)** <u>**මිණුම්කරණ පදනම**</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

**3) <u>ආදායම් හඳුනාගැනීම</u>**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේ දී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**4) <u>දේපළ, පිරියත උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපල පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපල පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවල දී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

**5) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

**6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>**

2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

**7) <u>මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම</u>**

2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2020 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාල ගැලපුම් සිදුකර ඇත.

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය - අදාල නොවේ

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 208,800,000 | 208,800,000 | 159,674,723 | 76 |
| ප්‍රාග්ධන | 191,200,000 | 288,305,600 | 280,717,028 | 97 |

## 3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 2021.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ශේෂය | 2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තා අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණ යට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | - | - | - | - |
| 9152 | යන්ත්‍රෝපකරණ | 146,792 | 146,792 | | 100 |
| 9153 | ඉඩම් | - | - | - | - |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

## 3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව

2021 වර්ෂය තුල දී විගණකාධිපති දෙපාර්තමේන්තුව මඟින් විගණන විමසුම් අටක් (08) මෙම දෙපාර්තමේන්තුවට යොමු කර ඇති අතර ඒ සියල්ලටම නිසි පරිදි පිළිතුරු ලබා දී ඇත.

# 4 කාර්ය සාධන දර්ශක

## 4.1 රජයේ වියදම් දැරීම සම්බන්ධයෙන් 2021 වර්ෂයේ නිකුත් කළ චක්‍රලේඛ

2022 වසර සඳහාවූ අයවැය කථාව මඟින් 2022 වර්ෂයේ වියදම් දැරීම සඳහා වොරන්ට් බලපත්‍ර, කාර්තුමය වශයෙන් නිකුත් කිරීමට යෝජනා කරන ලදී. එසේ වොරන්ට් බලපත්‍ර නිකුත් කිරීම සහ බැඳීම් කළමනාකරණය පිළිබඳ උපදෙස් ලබාදෙමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

2022 වර්ෂයේ අයවැය සකස් කිරීමේ මාර්ගෝපදේශ ඇතුළත් චක්‍රලේඛයක් ද 2022 වර්ෂයට අදාළ විසර්ජන පනත මඟින් වෙන්කළ ප්‍රතිපාදන යටතේ වියදම් දැරීම සහා බලය ලබා දීම වෙනුවෙන් ද චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

**රාජ්‍ය වියදම් කළමනාකරණයට අදාළව නිකුත් කරන ලද චක්‍රලේඛ**

| චක්‍රලේඛ අංකය | දිනය | විෂයය |
|---|---|---|
| NB/03/2021 | 2021.12.21 | 2022 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා බලය දීම හා රාජ්‍ය වියදම් කළමනාකරණය |
| NB/02/2021 | 2021.12.06 | කාර්තුමය වොරන්ට් බලපත්‍ර නිකුත් කිරීම හා බැඳීම් කළමනාකරණය |
| NB/01/2021 | 2021.07.28 | අයවැය කැඳවීම -2022 (2022-2024 මධ්‍යකාලීන අයවැය රාමුව තුළ 2022 වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශ) |

# 5 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම වනුයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුළු රාජ්‍ය ආයතන විසින් ඉටු කළ යුතු කාර්යයන් සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් ඇස්තමේන්තුගත කිරීම හා විසර්ජනය කිරීම වන බැවින් ඉලක්ක 17ක්, අරමුණු 169 ක් හා මූලික කාර්ය සාධන දර්ශක 244 ක් සහිත 2030 සඳහා වන තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සෘජුවම අදාළ නොවේ.

කෙසේවුවද, මූල්‍ය ප්‍රතිපාදන නොමැතිව අනෙකුත් ආයතනවලට තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගත නොහැකි බැවින්, සියළුම ඉලක්කයන් දෙපාර්තමේන්තුවට වක්‍රව අදාළ වන බව හඳුනාගෙන ඇත. ඒ අනුව, ජාතික අයවැය මඟින් එම ආයතන වෙත අරමුදල් ලබාදීමේ දී තිරසර සංවර්ධන ඉලක්ක ලඟාකර ගත හැකි පරිදි අයවැයකරණ ක්‍රියාවලිය ප්‍රවාහ ගතකිරීමට දෙපාර්තමේන්තුව විසින් පියවර ගෙන ඇත.

2021 අයවැය මඟින් ඒ ඒ ආයතන විසින් සිදුකරන ප්‍රධාන ව්‍යාපෘති කවර තිරසර සංවර්ධන අරමුණුවලට සම්බන්ධ ද යන්න දක්වා ඇති අතර තිරසර සංවර්ධන අරමුණුවලට අදාළ ඉලක්ක ඉටුකරගැනීමට හැකිවන පරිදි ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර ඇත. 2021 අයවැය ඇස්තමේන්තුව අනුව රාජ්‍ය ආයතනයන් වෙත තිරසර සංවර්ධන ඉලක්කයන් ලඟාකර ගැනීම සඳහා වන කාර්යයන් වෙනුවෙන් රු. බිලියන 885 ක් හෙවත් මුළු ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් සියයට 78 ක ප්‍රමාණයක් වෙන්කර ඇත.

# 6 මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / අතිරික්ත |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 37 | 27 | 10 |
| තෘතීයික | 04 | 03 | 01 |
| ද්විතීයික | 68 | 52 | 16 |
| ප්‍රාථමික | 38 | 29 | 09 |
| එකතුව | 147 | 111 | 36 |

## 6.2 මානව සම්පත් හිඟය සහ කාර්ය සාධනය

කාර්යය මණ්ඩලයේ හිඟය නිසා රාජකාරී කටයුතු ඉටුකිරීමේ දී දෙපාර්තමේන්තුවට දුෂ්කරතාවයන් වලට මුහුණ දීමට සිදුවේ.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම / ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| රජයේ කාර්ය සාධන කළමනාකරණය පිළිබඳ පොදුරාජ්‍ය මණ්ඩලීය මාර්ගගත පුහුණු වැඩසටහන (ආසියාවේ සංස්කරණය) | 01 | දින 05 | - | - | අතථ්‍ය විදේශීය | කාර්යාලීය කටයුතුවලදී භාවිත කිරීමට මෙම දැනුම වැදගත් වේ. |
| සාර්ව ආර්ථික පුරෝකථනය | 01 | දින 12 | - | - | අතථ්‍ය විදේශීය | ඇස්තමේන්තු සකස් කිරීමේ කටයුතුවලදී භාවිත කිරීමට මෙම දැනුම වැදගත් වේ. |
| මූල්‍ය වැඩසටහන්කරණය සහ ප්‍රතිපත්ති | 01 | දින 02 | - | - | අතථ්‍ය විදේශීය | කාර්යාලීය කටයුතුවලදී භාවිත කිරීමට මෙම දැනුම වැදගත් වේ. |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම / ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| රාජ්‍ය වියදම් කළමනාකරණය | 03 | දින 12 | - | - | අතථ්‍ය විදේශීය | ඇස්තමේන්තු සකස් කිරීමේ කටයුතුවලදී භාවිත කිරීමට මෙම දැනුම වැදගත් වේ. |
| රජයේ වැටුප් පද්ධතිය පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | දින 03 | 5,000 | - | අතථ්‍ය දේශීය | ගිණුම් සකස් කිරීමේ කාර්යාලීය කටයුතුවලදී භාවිත කිරීමට මෙම දැනුම වැදගත් වේ. |
| තිරසර සංවර්ධන ඉලක්ක ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ උපදේශන වැඩමුළුව | 01 | දින 01 | - | - | දේශීය | රාජකාරී කටයුතුවලදී භාවිත කිරීමට මෙම දැනුම වැදගත් වේ. |
| දෙමළ භාෂා ප්‍රවීණතාවය සඳහා වන පැය 200 රාජ්‍ය භාෂා පුහුණු වැඩසටහන | 02 | දින 26 | 30,000 | - | දේශීය | රාජකාරී කටයුතුවලදී භාවිත කිරීමට මෙම දැනුම වැදගත් වේ. |
| කණිෂ්ඨ විධායක නිලධාරීන් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමාව | 01 | සති 36 | 75,000 | - | දේශීය | රාජකාරී කටයුතුවලදී භාවිත කිරීමට මෙම දැනුම වැදගත් වේ. |

2020 මාර්තු මාසයේ සිට පැවැති කොවිඩ් -19 වසංගත තත්ත්වය දිගින් දිගටම පැවතීම හේතුවෙන් සැළසුම් කළ ආකාරයට දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකිවීම හේතුවෙන් 2021 වසරේ කාර්ය මණ්ඩල පුහුණු කිරීම් අවම තත්ත්වයක පැවතුනි.

# 7 අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළකවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | - | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.6 | වෙනත් | - | | |
| **2** | **පොත්පත් හා ලේඛණ නඩත්තු කිරීම** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛණ/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛණය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |

| | | |
|---|---|---|
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | **අනුකූල වේ** |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** |
| 2.8 | තොග ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** |
| 2.9 | හානි පාඩු ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** |
| 2.10 | බැරකම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** |
| 2.11 | උප පත්‍රිකා පොත් (GA-N20) ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | |
| 3.1 | ආයතනය තුළ මූල්‍ය බලතල පවරා දී තිබීම | **අනුකූල වේ** |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | **අනුකූල වේ** |
| 3.3 | සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | **අනුකූල වේ** |
| 3.4 | 2014.05.11 දිනැති අංක 17/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරුන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | **අනුකූල වේ** |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | **අනුකූල වේ** |

| | | |
|---|---|---|
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | **අනුකූල වේ** |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | **අනුකූල වේ** |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | **අනුකූල වේ** |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම | **අනුකූල වේ** |
| **5** | **විගණන විමසුම්** | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබේ | **අනුකූල වේ** |
| **6** | **අභ්‍යන්තර විගණනය** | |
| 6.1 | මු.රෙ. 134(2)DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | **අනුකූල වේ** |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | **අනුකූල වේ** |
| 6.3 | 2018 අංක 19 දරන ජාතික විගනන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ** |

| | | | |
|---|---|---|---|
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ** | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1/2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | **අනුකූල වේ** | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් 2021.09.06 දිනැතිව නිකුත් කරන ලද 2021 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම යන ලිපිය මඟින් ගෝලීය covid – 19 වසංගත තත්ත්වය හේතුවෙන් වර්ෂයකට විගණන කළමනාකරණ කමිටු රැස්වීම 04 ක් පැවැත්වීමේ අවශ්‍යතාවය ඉවත්කර ඇත. ඒ අනුව, 2021 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු 02ක් පවත්වා ඇත. |
| **8** | **වත්කම් කළමනාකරණය** | | |
| 8.1 | අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම | **අනුකූල වේ** | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර තිබීම | **අනුකූල වේ** | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ** | |

| | | |
|---|---|---|
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | **අනුකූල වේ** |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | **අනුකූල වේ** |
| **9** | **වාහන කළමනාකරණය** | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | **අනුකූල වේ** |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | **අනුකූල වේ** |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කර තිබීම | **අනුකූල වේ** |
| 9.5 | 2016.12.29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | **අනුකූල වේ** |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ** |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | **අනුකූල වේ** |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් අතුළත නිරවුල් කර තිබීම | **අනුකූල වේ** |

| | | | | |
|---|---|---|---|---|
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | **අනුකූල වේ** | | |
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම | **අනුකූල වේ** | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට අනුකූල වීම | **අනුකූල වේ** | | |
| 12.2 | හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | **අනුකූල වේ** | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | **අනුකූල නොවේ** | - | ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නීති කටයුතු දෙපාර්තමේන්තු වේ උපදෙස් අපේක්ෂා කෙරේ |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | **අනුකූල වේ** | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | **අනුකූල වේ** | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | **අනුකූල වේ** | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාය ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | **අනුකූල වේ** | | |

| | | |
|---|---|---|
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | **අනුකූල වේ** |
| **15** | **ආදායම් ගිණුම** | |
| 15.1 | අදාල රෙගුලාසිවලට අනුකූලව රැස්කළ ආදායමින් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | - |
| 15.2 | රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කොට තිබීම | - |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | - |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | **අනුකූල වේ** |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | **අනුකූල වේ** |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ** |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛණයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | **අනුකූල වේ** |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් | **අනුකූල වේ** |

| | | |
|---|---|---|
| | හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | **අනුකූල වේ** |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | **අනුකූල වේ** |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කර තිබීම | **අනුකූල වේ** |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලසුම තුළ තහවුරු කොට තිබීම | **අනුකූල වේ** |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | **මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ට අනුකූල වේ** |

| | | |
|---|---|---|
| 19.4 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | **අනුකූල වේ** |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | **අනුකූල වේ** |

# 8 ඇමුණුම - I

මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති මතය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඊපීඩී/ඒ/එන්බීඩී/2/21/11
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2022 ජුනි 08 දින

ගණන්දීමේ නිලධාරී
ජාතික අයවැය දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 240- ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 240-ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

4

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

#### 2.1.1 ආදායම් සංකේත - 2003.04.00 රජයේ නිලධාරීන්ට ලබා දෙන යතුරුපැදි සම්බන්ධ මූලික ගෙවීම

2015 වර්ෂයේ අයවැය යෝජනාවක් වූ ක්ෂේත්‍ර නිලධාරීන් හට යතුරුපැදි ලබාදීමේ වැඩසටහනට අදාලව යතුරුපැදි සඳහා වූ මූලික ගෙවීම, බදු නොවන ආදායමක් ලෙස දෙපාර්තමේන්තුව විසින් ඉහත කී ආදායම් සංකේතය යටතේ ගිණුම්ගත කර තිබුණි. එසේ ලබා දුන් සියළුම යතුරුපැදි 2020 වර්ෂය අවසාන වන විට අදාල නිලධාරීන්ගේ පෞද්ගලික අයිතියට පැවරීම අවසාන විය යුතුව තිබුණි. එසේ වුවද එම වැඩසටහනට අදාලව මූලික ගෙවීම ලෙස රු.2,910,000 ක ශුද්ධ ආදායමක් 2021 වර්ෂයේදී ලැබී තිබුණි. ඒ අනුව අදාළ අයවැය යෝජනාව ක්‍රියාත්මක කර අවසන්ව තිබියදීත්, ඊට අදාළ විධිමත් උපදෙස් ලබා දෙමින් ගිණුම් ගත කිරීම අවසන් කර නොතිබුණි.

### 2.2. වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සලසා තිබුණු ප්‍රතිපාදන නිෂ්ඵල වීම

වැය විෂයන් 2 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. 5,100,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමනින්ම ඉතිරි කර තිබුණි.

(ආ) අධිප්‍රතිපාදන සලසා තිබීම

සමාලෝචන වර්ෂයේදී වැය විෂයයන් 7 ක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 27 ක සිට සියයට 96 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

### 2.3 අත්තිකාරම් ගිණුම්

#### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 නොවැම්බර් 03 දින වයස අවු. 60 සම්පූර්ණ වී විශ්‍රාම ගිය නිලධාරියෙක්ගේ රු.151,360 ක ණය ශේෂය 2022 මාර්තු 04 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

5

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ආ) 2020 සැප්තැම්බර් 18 හා 2021 පෙබරවාරි 16 දිනවල මියගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු පිළිවෙළින් රු.102,499 ක් හා රු.101,561 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඇ) 2015 සැප්තැම්බර් 23 දින රාජකාරියට වාර්තා නොකිරීම හේතුවෙන් සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු 150,119 ක ණය ශේෂය 2021 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**2.4 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

2021 දෙසැම්බර් මාසය වෙනුවෙන් රු. 25,750 ක වියදම් 2022 වර්ෂයේදී ගෙවා තිබුණද මූල්‍ය ප්‍රකාශනවල එය බැඳීම් හා බැරකම් යටතේ දක්වා නොතිබුණි.

**2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | මු.රෙ. 395 (ඌ) ප්‍රකාරව බැංකු සැසඳුම පිළියෙල කළ යුත්තේ එකතු වන මුදල් බැංකුවේ තැන්පත් කිරීම, චෙක් පත් ලිවීම හෝ මුදල් පොත පවත්වා ගැනීම ගැන කිසිදු සම්බන්ධතාවයක් නොමැති නිලධාරියෙකු විසින් වුවත්, දෙපාර්තමේන්තුවේ චෙක්පත් ලියන නිලධාරියා විසින්ම බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කර තිබුණි. |
| (ආ) | 2021 දෙසැම්බර් 30 දිනැති අංක SA/MAA/02/01/01 දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | එම ලිපිය මගින් 2021 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට අදාල ACA – 6 හා ACA – 7 ආකෘති සංශෝධනය කර තිබුණි. 2021 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය සෘණ රු.32,732,054 ක් වී තිබුණි. සංශෝධිත ACA – 7 ආකෘතියේ සඳහන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුවද 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගැලපුම් ශේෂය සෘණ රු. 32,732,054 ක් වී ඇත. නමුත් |

6

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

අග්‍රිම ගැලපුම් ශේෂය ධන (+) රු.32,732,054 ක් විය යුතුව තිබුණත් එය සෘණ සංඛ්‍යාවක් ලෙස දක්වා තිබීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය 0 ක් ලෙස දැක්වීම තාර්කිකව සිදු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් හා ගබඩා, වාණිජ අත්තිකාරම් ගිණුම් වලට අදාළ සීමා නොපිළිපැදීම**

(i) 2020 අංක 7 දරන විසර්ජන පනතේ තෙවන උපලේඛනයේ සඳහන් රාජ්‍ය අමාත්‍යාංශයක් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක් සඳහා පිළිවෙළින් රු.32,000,000 ක් හා රු.17,000,000 ක් බැගින් උපරිම වියදම් සීමාවන් පනවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම අමාත්‍යාංශය හා කාර්යාලය විසින් එම සීමාවන් පිළිවෙළින් රු. 1,401,679 කින් හා රු.208,590 කින් ඉක්මවා අත්තිකාරම් ගෙවා තිබුණි.

(ii) 2020 අංක 7 දරන විසර්ජන පනතේ තෙවන උපලේඛනයේ කොමිෂන් සභා දෙකක් සඳහා අත්තිකාරම් ගිණුමේ අවම සීමාවන් ලෙස පිළිවෙළින් රු.500,000 ක හා රු. 200,000 ක සීමා පනවා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම කොමිෂන් සභා ක්‍රියාත්මක නොවීම නිසා ලැබීම් වාර්තා වී නොතිබුණි. එහෙත් එම කොමිෂන් සභා විසින් අවම ලැබීම් සීමාවට ළඟා වී නොතිබුණි.

**3.1.2 රාජ්‍ය ව්‍යාපාර අධීක්ෂණ කටයුතු**

ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් අධීක්ෂණය කරනු ලබන ආයතන 117 ට අදාල ක්‍රියාකාරකම් කිසිවක් අයවැය දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්මේ හෝ කාර්යසාධන වාර්තාවේ ඇතුළත් කර නොතිබුණු අතර එම අධීක්ෂණය කිරීමට අදාල තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

7

### 3.1.3 ජාතික අයවැය සකස් කිරීම

2021 වර්ෂය සඳහා අයවැය පිළියෙළ කිරීමට අදාල මාර්ගොපදේශයට අනුව 2021 - 2023 රාජ්‍ය ආයෝජන වැඩසටහන ප්‍රකාරව ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු කළ යුතුව තිබුණි. නමුත් එම රාජ්‍ය ආයෝජන වැඩසටහන 2021 අයවැය අවසන් වීමෙන් පසුව 2021 ජනවාරි 31 දින පිළියෙළ කර තිබීම නිසා 2021 අයවැය ඇස්තමේන්තුවේ මූලධන වියදම් ඇස්තමේන්තු කිරීම එම වැඩසටහනට අනුව සිදුවී නොතිබුණි.

### 3.1.4 1980 ජූලි වැඩ වර්ජනයට සහභාගි වී රැකියා අහිමිවූවන්ට සහන සැලසීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1980 ජූලි වැඩ වර්ජනයට සහභාගී වී රැකියා අහිමි වූ ස්ථිර ජීවනෝපාය මාර්ගයක් නොමැති වූ වයස අවු. 65 සම්පූර්ණ පුද්ගලයන්ට සහන සැලසීම සඳහා 2013 වර්ෂයේ අයවැය යෝජනා කිරීමේදී නිවැරදි ප්‍රතිලාභීන් හඳුනාගැනීමකින් තොරව සිදු කර තිබුණි.

(ආ) 2015 අයවැය යෝජනාවලදී 1980 රැකියා අහිමි වූ ජූලි වැඩ වර්ජකයන් හට ගෙවනු ලබන දීමනාව රු.5,000 ක සිට රු.6,000 ක් දක්වා වැඩි කිරීමටත්, හිමිකම ලැබීමට අදාළ වයස අවු.63 ක් දක්වා අඩු කිරීමටත්, එම සේවකයින්ගේ වැන්දඹුවන්ට මෙම දීමනාව ලබා දීමටත් යෝජනා වී තිබුණු අතර දීමනාව රු.5,000 ක සිට රු.6,000 ක් දක්වා වැඩි කර තිබුණද, ඊට අදාළ වයස් සීමාව අවු.63 ක් දක්වා අඩු කිරීම හා වැන්දඹුවන්ට එම දීමනාව ලබාදීම ක්‍රියාත්මක වී නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී යෝජනා වූ වැන්දඹුවන්ට වන්දි ගෙවීම මේ වනවිටත් ක්‍රියාත්මක නොවීම හා 1980 ජූලි වැඩවර්ජනය හේතුවෙන් රැකියා අහිමි වී තම දරු පවුල් නඩත්තු කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් සියදිවි හානි කරගත් සේවකයින් 138 දෙනෙකු පමණ වන බවත් ඔවුන් හට කිසිදු පිළිසරණක් 2022 මැයි 31 දින වනවිටත් ලැබී නොතිබුණි.

### 3.1.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන අයවැය චක්‍රලේඛ ප්‍රකාරව අනෙකුත් රාජ්‍ය ආයතන වෙනුවෙන් මූල්‍ය කල්බදු යටතේ මිලදී ගන්නා ලද එකතුව රු.4,229,677,479 ක් වූ වාහන පවරා ගන්නා ලෙස අදාල ආයතන දැනුවත් කර

තිබුණ ද, එම පවරා දීම අවසාන බවට තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි.

(ආ) 2014 ජුලි 23 දිනැති අංක 02/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛ ප්‍රකාරව ක්ෂේත්‍ර නිලධාරීන්ට ලබා දුන් යතුරුපැදි වල ලියාපදිංචි අයිතිය වසර 5 ක කාලයකට පසුව පෞද්ගලික නමට පැවරෙන නමුත් එම මෝටර් සයිකල් පවරා ගැනීමේ කටයුතු අවසාන බවට තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි.

(ඇ) 2021 ජුනි 11 දින මුදල් අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ගිලන් රථ 50 ක්, වතුර බවුසර් 50 ක් හා ඩබල් කැබ් රථ 50 ක් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ කඩිනමින් ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත සංදේශයක් ඉදිරිපත් කර තිබුණි. අමාත්‍ය මණ්ඩලය විසින් 2021 ජුනි 29 දින ඒ සඳහා අනුමැතිය ලබා දී තිබුණි. මේ සමඟ ප්‍රාඩෝ රථ 225 ක් එම පදනම මත ලබා ගැනීමට ද අපේක්ෂා කර තිබුණි. එම ප්‍රාඩෝ රථ කල්බදු ක්‍රමය යටතේ මිලදී ගැනීමේදී වතුර බවුසර 2 ක් , ඩබල් කැබ් රථ 12 ක් නොමිලේ ලබා දීමට අදාල වාහන විකුණුම්කරු එකඟ වී තිබුණි.

ප්‍රාඩෝ රථ 225 රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් අනුව ලබා නොගැනීමට තීරණය කිරීම නිසා අදාල වාහන විකුණුම් සමාගම විසින් නොමිලේ ලබා දෙන බවට එකඟ වූ වතුර බවුසර 2 ක් සහ ඩබල් කැබ් රථ 12 ක් ලබාදීම ප්‍රතික්ෂේප කර තිබුණි. 2021 ජුලි 28 දින මුදල් අමාත්‍යාංශය විසින් එම නොමිලේ ලබා දෙන බවට එකඟ වූ වතුර බවුසර 2 ට හා ඩබල් කැබ් රථ 12 ට මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩලය සංදේශයක් ඉදිරිපත් කර තිබුණි. ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2021 අගෝස්තු 18 වන දින ලැබී තිබුණි. වාහන ලබා ගැනීමේදී පළමුව තීරණය කර තිබුණු ඩබල් කැබ් රථ 50, ගිලන් රථ 50 හා වතුර බවුසර් 50 සඳහා පැරණි මිල ගණන් යටතේ කල්බදු වාරික මත ජාතික අයවැය දෙපාර්තමේන්තුව ලබාගෙන තිබුණි. පසුව අනුමැතිය ලැබී තිබුණු වතුර බවුසර් 02 ට හා ඩබල් කැබ් රථ 12 ක් ලබා ගැනීමට එ.ජ.ඩොලර් 461,606 ක අතිරේක වියදමක් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2021 ජුනි 29 දින අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ කැබ් රථයක් එ.ජ.ඩොලර් 26,167 කට ලබා ගැනීමට තීරණය වූ අතර, නොමිලේ ලබා දීමට එකඟ වූ කැබ් රථ සඳහා ගෙවීම් කිරීමේදී එක් කැබ් රථයකට එ.ජ.ඩොලර් 44,484 ක් වී තිබුණි. ඒ අනුව, එක් කැබ් රථයක් සඳහා එ.ජ.ඩොලර් 18,317 ක් වැඩිපුර ගෙවා තිබුණි. ඒ අනුව, මුළු වැඩිපුර ගෙවීම් එ.ජ.ඩොලර් 219,804 ක් වි තිබුණි.

(ii) 2021 දෙසැම්බර් 31 දින වන විට විගණනය සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව කැබ් රථ 11 ක් තවමත් රාජ්‍ය ආයතනවලින් ඉල්ලීම් ඉදිරිපත් නොවීම නිසා අයවැය දෙපාර්තමේන්තුව තුළ රඳවාගෙන තිබුණි.

(iii) 2021 වර්ෂය තුළ ආයතන වලට පවරා දුන් කල්බදු වාහන අදාළ ආයතන විසින් භාරගත් බවට තහවුරු කිරීමේ ලිපි, ලිපි ගොනුවේ ඇතුළත් නොවූ අතර පහත සඳහන් ආයතන වලට එම රථ වල අයිතිය පවරා දුන් බව ගොනුවේ සඳහන් වී තිබුණද ඊට අදාල ලිඛිත සාක්ෂි ගොනුවේ නොතිබුණි.

| ආයතනය | පවරා දුන් වාහන වර්ගය | පවරා දුන් වාහන සංඛ්‍යාව |
|---|---|---|
| වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | වතුර බවුසර් | 10 |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව | වතුර බවුසර් | 10 |
| ප්‍රාදේශීය සභා | වතුර බවුසර් | 32 |
| ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව් ,ජලාශ හා වාරි මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | ඩබල් කැබ් රථ | 02 |
| රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | ඩබල් කැබ් රථ | 01 |

(ඉ) 2021 වර්ෂයේදී ගෙන්වන ලද වාහන 164 ක් රාජ්‍ය ආයතන අතර බෙදාදීමේදී එම ආයතන කරන ලද ඉල්ලීම් සලකා ඔවුන්ගේ අවශ්‍යතාවලට ප්‍රමුඛස්ථානය දෙමින් වාහන ලබාදීමට යෝජනා වී තිබුණත්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉල්ලීම් නොකරන ලද ඩබල් කැබ් රථ 05ක් එම ආයතන වෙත ලබාදීමට කටයුතු කර තිබුණි. තවද, ප්‍රාදේශීය සභාව වෙත ජල බවුසර් 32ක් ලබා දී තිබුණත් එම සභාවන් විසින් වතුර බවුසර් සඳහා ඉල්ලීම් කර තිබුණු බව සනාථ කරන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) ඉහත කී 1990 සුවසැරිය පදනම සඳහා මූල්‍ය කල්බදු ගිවිසුම යටතේ ලබා ගත් ටොයෝටා ගිලන් රථ 25 ක් භාවිතයට සුදුසු පරිදි පිළියෙළ කිරීම සඳහා රු. මිලියන 25 ක ප්‍රතිපාදන අවශ්‍ය බව අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත වරින් වර ඉල්ලීම් ඉදිරිපත් කර තිබුණ ද, ප්‍රතිපාදන ලබා නොදීම මත එම රථ භාවිතයට ගෙන නොතිබුණි. තවද, 2022 මැයි 25 දින වන විටත් මෙම ගිලන් රථ සැපයුම්කාර සමාගමේ වාහන අංගනයෙන් ඉවත් කරගෙන නොමැති බවත් ඒවා ඉතා ඉක්මනින් ඉවත් කර ගන්නා ලෙසත් සුවසැරිය පදනම වෙත දන්වා තිබුණි. ඒ අනුව,

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

අවශ්‍යතාවය හා අදාල පිරිවිතරයන් පිළිබඳ අනවබෝධයකින් ගිලන්රථ 25 ක් සඳහා රු. මිලියන 103.38 ක් වැය කර තිබුණු බව නිරීක්ෂණය විය.

**4. මානව සම්පත් කළමනාකරණය**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 6 ක් ද, ද්වීතික මට්ටමේ තනතුරු 9 ක් ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 2 ක් ලෙස එකතුව තනතුරු පුරප්පාඩු 17 ක් පැවතුණි.

ඩී.ඒ.ඒ. වනිගසේකර
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට